**ශීර්ෂය 296 - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්වාගණනය කළ මතය**

---

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 30 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 තැන්පතු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තැන්පතු අංක **6000-0-0-18-127** දරන ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීමේ ගිණුමෙහි **2021** දෙසැම්බර් **31** දිනට ශේෂය දෙපාර්තමේන්තු පොත් අනුව රු.**3,000,000** ක් වුවද, එය භාණ්ඩාගාර පොත් අනුව රු.**2,995,025** ක් වීමෙන් රු.**4,975** ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට හේතු මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මෙම වෙනස ආදායමට ගිණුම්ගත කරන ලද රු.4,975 ක වටිනාකමක් සහිත ජ'නල සටහන මාසික ගිණුම් සාරාංශයෙන් හා මහ භාණ්ඩාගාරය මඟින් දෙවරක් ගෙවීමක් ලෙස සටහන් වීම හේතුවෙන් සිදු වී ඇත.<br>මෙය මහා භාණ්ඩාගාරය විසින් 2022 මාර්තු මස නිවැරදි කර ඇත. | වෙනසට හේතු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුය. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ **2021** නොවැම්බර් **26** දිනැති අංක **2021/03** දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය **7.6** ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මුදල් සහ හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගත යුතු වුවද, හරස් සටහන් මඟින් අත්තිකාරම් අයකර ගැනීම් රු.**3,806,409** ක් ද අත්තිකාරම් පියවීම් රු.**5,469,414** ක් ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.**1,663,005** කින් අඩුවෙන් දක්වා තිබුණි. | අත්තිකාරම් ගිණුමේ හරස් සටහන් ලැබීම් හා ගෙවීම් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ගැලපුම් සටහනක් ලෙස පෙන්නුම් කරනු ලබන බැවින් හා මෙහෙයුම් ක්‍රියාකරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය මුළු මූලධන වියදම් වලට සමාන විය යුතු බැවින් අත්තිකාරම් ගිණුමේ හරස් සටහන් ලැබීම් හා ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කර නැත. | චක්‍රලේඛ ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කළ යුතුය. |
| (ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහයේ තැන්පතු ගෙවීම් වටිනාකම රු.**3,058,700** ක් වුවද, භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.**3,063,675** වීමෙන් රු.**4,975** ක වෙනසක් නිරීක්ෂණය වුණි. | **CIGAS** වැඩසටහනෙහි තැන්පත් ගිණුමේ ඉහත ජ'නල සටහන නිවැරදිව ඇතුලත් වී ඇති අතර එම නිවැරදි තැන්පත් ගෙවීම් වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුලත් කර ඇත. | වෙනසට හේතු මූල්‍ය ප්‍රකාශවල දැක්විය යුතුය. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** ඇප ලේඛනය<br>මුදල් රෙගුලාසි 891 (1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන්ගේ නම් ඇතුළත් ඇප ලේඛනයක් අකාරාදී ක්‍රමයට පිළියෙළ කොට පවත්වාගෙන යා යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු නිලධාරීන් 13 ක් සිටියද එවැනි ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. | ඇප ලේඛනයක් ආරම්භ කර ඇති අතර ඇප මුදල් අය කිරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අයදුම්පත් අතුරින් අනුමැතිය ලද පාලක ජනරාල්ගේ අයදුම්පතට අදාළව පාලක ජනරාල් ඇප තැබීම සිදු කර ඇත. තව දුරටත් ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන ඇති අතර ඒ සඳහා ක්‍රියා කරමින් පවතී. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| **(ආ)** වාහන ලොග් පොත්<br>මුදල් රෙගුලාසි 1645 (අ) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාර වාහන ලොග් පොත් සෑම වාහනයක් සම්බන්ධයෙන්ම යාවත්කාලීනව පවත්වාගත යුතු වුවද, දෙපාර්තමේන්තු වාහන ඇණියට අදාල ලොග්පොත්වල වාහනය පිළිබඳ විස්තරයෙහි ඇතුළත් විය යුතු කරුණු නිසි පරිදි සම්පූර්ණකර නොතිබූ බව නිරීක්ෂණය විය. | වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී ආදායම් සංකේත අංක 1001-0-3-0-0-0 බලපත්‍ර ආදායම් සඳහා මූලික ඇස්තමේන්තුව රු.1,450,000 ක් වූ අතර සංශෝධිත ඇස්තමේන්තුව රු.2,800,000 ක් වීමෙන් රු.1,350,000 ක විචලතාවයක් නිරීක්ෂණය වූ අතර එය මූලික ඇස්තමේන්තුවෙන් සියයට 93 ක විචලතාවයකි. | 2020 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තු පිළියෙළ කරන අවස්ථාවෙන් පසුව පාලනයට යටත් කරන ලද භාණ්ඩ අයිතම සංඛ්‍යාව ඉහළ යාම හේතුවෙන්, දෙපාර්තමේන්තු ආදායමට ඇති වී ඇති බලපෑම සමාලෝචනය කර වර්ෂය මැද ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කිරීමට කටයුතු කරන ලදි. | තාත්ත්වික පදනමින් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයයන් 04 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 100 ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීමක් නිරීක්ෂණය විය. | ඔබගේ නිරීක්ෂණයන් හා එකඟ වේ. | තාත්ත්වික පදනමින් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය විෂය 09 ක මූලික ඇස්තමේන්තු හා සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර සියයට 16 සිට සියයට 76 දක්වා වූ පරාසයක විචලතාවයක් නිරීක්ෂණය විය. | 2020 වර්ෂයේ වියදම් ඇස්තමේන්තු පිළියෙල කරන අවස්ථාවෙන් පසුව දෙපාර්තමේන්තු පාලනයෙන් බැහැරව සිදු වූ විවිධ හේතු නිසා එක් එක් වැය විෂයය යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන සංශෝධනය කරන ලදි. | මූලික ඇස්තමේන්තු සකස් කිරීමේදී පසුගිය වර්ෂයන්හි වියදම් පිළිබඳ සමාලෝචනයක් සිදු කර හැකිතාක් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පුරෝකථනය කළ යුතු බව. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී මුලධන වැය විෂයයන් 03 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 38 සිට සියයට 61 ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීම් පැවති බව නිරීක්ෂණය විය. | ඔබගේ නිරීක්ෂණයන් හා එකඟ වේ. | තාත්වික පදනමින් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුයි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ මූලධන වැය විෂයය දෙකක ප්‍රතිපාදන මු.රෙ 66/69 වීරමොං ක්‍රියාපටිපාටිය මගින් වෙනස් කර තිබුණි. ඒ හේතුවෙන් එම වැය විෂයයන් දෙකෙහි මූලික ඇස්තමේන්තු හා සංශෝධිත ඇස්තමේන්තු අතර විචලතාවය සියයට 65 ක් සහ 162 ක් බව නිරීක්ෂණය විය. | 2020 වර්ෂයේ වියදම් ඇස්තමේන්තු පිළියෙල කරන අවස්ථාවෙන් පසුව දෙපාර්තමේන්තු පාලනයෙන් බැහැරව සිදු වූ විවිධ හේතූන් නිසා එක් එක් වැය විෂයය යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන සංශෝධනය කරන ලදි. | -එම- |

## 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම | මාණ්ඩලික නිලධාරි රැස්වීම් වලදී පවතින අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් පිළිබඳව වරින් වර සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඒවා ශක්තිමත් කිරීම සඳහා අවස්ථානුකූලව අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීමට පියවර ගෙන ඇත. එසේ වුවද ඒවායේ පිටපත් රජයේ | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණන අංශය වෙත යොමු කිරීමට කටයුතු කර නොමැති අතර ඉදිරියේදී එහි පිටපත් රජයේ විගණන අංශය වෙත යොමු කිරීමට සටහන් කර ඇත. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | | |
| 1987 ජුනි 20 දිනැති අංක 1978 අංක 28 දරන පනතින් සංශෝධිත 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනතේ 11 E වගන්තිය | ප්‍රමිතියට පටහැනිව ආනයන සිදු කරන ආනයනකරුවන් ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් එසේ කර නොතිබුණි. | මෙහි වර්තමාන තත්වය වනුයේ දැනටමත් අවසන් වශයෙන් කෙටුම්පත් කර ඇති ආනයනකරුවන් අසාධු ලේඛනගත කිරීමට (Black List) අදාළ ගැසට් නිවේදනය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අදාල කෙටුම්පත්‍රයට සංශෝධන කීපයක් සිදු කරන ලෙස යෝජනා කර ඇත. එම සංශෝධන ඇතුලත් කර අදාල ගැසට් පත්‍රය ඉදිරියේදී ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරමින් පවතී. | අදාළ ආනයනකරුවන්ගේ විස්තර ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතු වීම. |
| (ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝ මීටර 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ යන | මේ වන විට වාහන දෙකක් සඳහා ඉන්ධන පරීක්ෂාවක් සිදු කර ඇති අතර, ඉතිරි වාහන 05 සඳහා කඩිනමින් ඉන්ධන පරීක්ෂාවන් සිදු කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවන් සිදු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද දෙපාර්තමේන්තුවේ වාහන 07 න් 06 ක් සඳහා එසේ පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. | | |

(ඇ) මුදල් රෙගුලාසි

-----------------

| | | | |
|---|---|---|---|
| (i) මු.රෙ. 1647 (ඉ) | වාහන භාර නිලධාරීන් විසින් තමා භාරයේ ඇති මෝටර් වාහන වර්ගය, මෝස්තරය, ලියාපදිංචි අංකය හා ඒ පිළිබඳ තොරතුරු ඇතුලත් කර මෝටර් වාහන ලැයිස්තුවක් පවත්වාගෙන යා යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මින් ඉදිරියට මෙම දෙපාර්තමේන්තුව සතු වාහන පිළිබඳ විස්තර ඇතුළත් මෝටර් වාහන ලැයිස්තුවක් පවත්වාගෙන යාමට කටයුතු කරන ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ii) මු.රෙ. 1646 | වාහන භාර නිලධාරීන් විසින් ඊළග මාසයේ 15 දින ගතවීමට ප්‍රථමව 268 (අ) වැනි ආකෘති පත්‍රයෙහි ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපතද සමඟ ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇතත් මාසිකව ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලදී. | -එම- |
| (iii) මු.රෙ. 371(2) (ආ) | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්වයේ නිලධාරින්ට පමණක් ලබාදෙන රු.100,000/- ක උපරිමය යටතේ වූ තත්කාර්යය අතුරු අග්‍රිමය අදාල විශේෂිත කාර්යයට ආසන්නතම දිනයකදී නිලධාරියා වෙත ලබාදියයුතු අතර නිලධාරියා විසින් එම කාර්යය නිමකල විගසම අග්‍රිමය පියවිය යුතුය. එසේ වුවද දෙපාර්තමේන්තුවේ නිලධාරින් 5 දෙනෙකු ලබාගත් රු. 2,500 සිට | කොවිඩ් - 19 වසංගත තත්වය හමුවේ වුවද දෙපාර්තමේන්තුවේ රාජකාරි අඛණ්ඩව පවත්වාගෙන යාමට චක්‍රීය ක්‍රමයට නිලධාරීන්ට සේවයට වාර්තා කිරීම සිදු විය. එබැවින් රාජකාරි ඉටු කිරීමේදී යම් ප්‍රමාදයන් සිදු විය. ඉදිරියේදී මෙවැනි සිදුවීම් සිදු නොවීමට අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | -එම- |

| | | | |
|---|---|---|---|
| | රු. 50,000 ක් දක්වා පරාසයක අත්තිකාරම් මුදල් පියවීම සඳහා දින 32 සිට 160 ක කාලපරාසයක් ගතකර තිබුණි. | | |
| (iv) මු.රෙ. 756 (6) | වාර්ෂික තොග සමීක්ෂණ වාර්තා ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවද එසේ කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 05/2016 පරිදි නියමිත කාලරාමුව තුළ භාණ්ඩ සමීක්ෂන මණ්ඩල පත් කිරීම සිදු කර සමීක්ෂණ කටයුතු ඉටු කිරීම සඳහා භාරදීමට කටයුතු කළ ද, එම නිලධාරීන්ගේ කාර්ය බහුලත්වයන් මත අවසන් වාර්තාව ලබා දීම ප්‍රමාද විය. | -එම- |

## 2.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවය හැරගොස් ඇති කළමනාකරණ සහකාර නිලධාරී මහතෙකුගෙන් වසර 04 ක් තිස්සේ අයවිය යුතු රු. 335,753 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | වැඩ තහනමට ලක් වූ ආර්.ඩී.එම්.ජයවික්‍රම මහතා වෙත රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චෝදනා පත්‍රය සම්බන්ධයෙන් විනය පරික්ෂණ කටයුතු අවසන් කර එහි ප්‍රතිඵල මෙම දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර නොමැත. එම ප්‍රතිඵල මත ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | හිඟ අත්තිකාරම් අය කර ගැනීමට කටයුතු කළ යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1969 ජනවාරි 16 දිනැති අංක 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණ, දැක්ම හා මෙහෙවර අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අහිතකර ලෙස බලපාන ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වේ. එහෙත් වර්තමානයේදී එක් එක් විෂයන්ට අදාල ආයතන විසින් කරනු ලබන ඉල්ලීම් මත පමණක් පදනම්ව කටයුතු කර තිබුණි. එබැවින් මෙම දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණ ඉටු වන ආකාරයට කටයුතු කිරීම සඳහා | අප දෙපාර්තමේන්ත්වේ දැක්ම හා මෙහෙවර ප්‍රකාශනය මගින් ශ්‍රී ලංකාවේ සමස්ථ පද්ධතිය සම්බන්ධව ආරක්ෂා කිරීම හා සුරක්ෂිත කිරීම ප්‍රධාන අරමුණ වේ. මෙහි දී සමස්ථ පද්ධතිය යන්නට ජාතික, ආර්ථික පරිසරය, මහජන සෞඛ්‍ය සහ මහජන ආරක්ෂාව අන්තර්ගත වේ. මේ නිසා මෙම දෙපාර්තමේන්තුවෙන් ආනයන හෝ අපනයන පාලන බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර ඉන් ලැබෙන බලපත්‍ර ගාස්තු හෝ අතිරේක ගාස්තු පමණක් නොව එම බලපත්‍රය නිකුත් කිරීමේ දී ඉහත කී සමස්ත පද්ධතියටම ප්‍රතිලාභ සහ සමාජීය පිරිවැය | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණු, දැක්ම, හා මෙහෙවර අනුව අහිතකර ආනයන හා අපනයනයන් පාලනය කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| පිළිගත් විද්‍යාත්මක ක්‍රමවේදයක් හෝ ක්‍රියා පටිපාටියක් නොමැති බව විගණනයට නිරීක්ෂණය විය. | ගැන සළකා නිකුත් කරන අතර ආනයනය හෝ අපනයනය කරනු ලබන භාණ්ඩ සම්බන්ධව ක්‍රියා කරනු ලබන ව්‍යවස්ථානුකූලව ආයතන ස්ථාපිත කර ඇත්නම් එම ආයතන වල නිර්දේශය මත පදනම්ව ආනයන හා අපනයන පාලන බලපත්‍ර ලබා දෙනු ලබයි. තවද මෙම දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව භාවිත කරනු ලබන ආසිකුඩා පද්ධතිය මගින් රේගු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වීමට අවශ්‍ය මූලික පියවර සකස් කර ඇති අතර සමහර භාණ්ඩ රේගු දෙපාර්තමේන්තුව වෙත නිදහස් කිරීමේදී එම පද්ධතිය හරහා මෙම දෙපාර්තමේන්තුවේ අනුමැතිය දැනටමත් දෙනු ලබයි. | |

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් මෘදුකාංග සංවර්ධනය සඳහා අනුමත කරන ලද ආයතන සමඟ මෘදුකාංග පද්ධති සම්බන්ධ කිරීම, ජාලගත වීම හා ජාලගත අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම වැනි කටයුතු සිදු කිරීම සඳහා ICTA ආයතනය සමඟ 2017 පෙබරවාරි 03 දින අවබෝධතා ගිවිසුම අත්සන් කර තිබූ අතර ඒ අනුව අරමුදල් සැපයීම ICTA ආයතනය විසින් සිදු කර තිබුණි. නමුත් මේ සඳහා විසර්ජන පනතින් ද 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රු.9,080,000 ක් ලබාගෙන තිබුණු අතර ඉන් රු. 8,119,035 ක් විවිධ කාර්යයන් සඳහා වියදම් කර තිබුණි. එහෙත් මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට සමාලෝචිත වර්ෂය තුළ ද කටයුතු කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුව ICTA ආයතනය සමඟ 2017.02.09 දිනැතිව අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම මඟින් දෙපාර්තමේන්තුව සඳහා ජාලගත බලපත්‍ර නිකුත් කිරීමේ වැඩසටහන් සකස් කිරීම සඳහා එකඟ වී තිබිණි. ඒ අනුව මෙම වැඩසටහන සකස් කිරීම සඳහා වන අවශ්‍ය ප්‍රතිපාදන ඍජුවම ICTA ආයතනය වෙත ලබා දී තිබුණි. ඒ අනුව ICTA ආයතනය විසින් තෝරා ගන්නා ලද ආයතනයක් මඟින් පරිගණක වැඩසටහනක් සකස් කර එහි පළමු අදියර දියත් කිරීම සඳහා පියවර ගෙන තිබිණි.<br>නමුත් මෙම අදියර දෙපාර්තමේන්තුවට සෑහිමකට පත්වන මට්ටමේ නොපැවතිම මත ඒවා නිවැරදි කරන ලෙස ලිඛිතව හා පවත්වන රැස්වීම් මඟින් ICTA ආයතනය වෙත දැනුම් දුන්නද ඒ සඳහා අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනිමට නොහැකි විය.<br>එබැවින් මෙම දෙපාර්තමේන්තුව විසින් දෙපාර්තමේන්තුවේ පැවති අභ්‍යන්තර පරිගණක පද්ධතිය සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීමෙන් පාරිභෝගික ජනතාව වෙත මාර්ගතව ලියාපදිංචි වීමටත්, අයදුම්පත් ඉදිරිපත් කිරිමටත් ,ගෙවීම් කටයුතු සිදු කිරිමට හා හරපත්‍ර ලබා ගැනිමටත් හැකිවන පරිදි ක්‍රියාකාරි සේවා ලබා දීමට පියවර ගන්නා ලදී.<br>දක්වා ඇති රු.8,119,035 ක වටිනාකම වැය කරන ලද්දේ අභ්‍යන්තර පරිගණක පද්ධතියක් දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මක කල හැකි වන | සැලසුම් කළ පරිදි නියමිත දිනට කාර්යය ඉටු කරවා ගැනීමට ක්‍රියාකාරීව මැදිහත් වී ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කළ යුතු වීම. |

පරිදි දෙපාර්තමේන්තුවේ විදුලි පරිපථ පද්ධතිය නවීකරණය කිරීම, දත්ත සම්ප්‍රේෂන රැහැන් පද්ධතිය ස්ථාපිත කිරීම, විදුලි සැපයුම් ඒකකයක් මිලදී ගැනීම, මෘදුකාංග යාවත්කාලීන කිරීම හා දෙපාර්තමේන්තුවේ ඒ වන විට පැවති අභ්‍යන්තර පරිගණක පද්ධතිය මාර්ගගත ක්‍රමය හරහා ක්‍රියාත්මක කල හැකි වන පරිදි වැඩි දියුණු කිරීම වෙනුවෙන් වේ.

**ICTA** ආයතනය මැදිහත් වීමෙන් ඇති කිරීමට යෝජිතව තිබූ මාර්ගගත පරිගණක වැඩසටහන වෙනුවෙන් මෙම වියදම් දරා නොමැත.

## 3.3 කළමනාකරණ දූර්වලතා

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ---------------------------------- | ------------ |
| (අ) ආනයනයන් සීමා කළ යුතු හා තහනම් කළ යුතු භාණ්ඩ ආනයනයෙන් වැලැක්වීම සඳහා වූ විධිවිධාන ඇතුළත් අංක 2044/40 සහ 2017 නොවැම්බර් 09 දිනැති ගැසට් පත්‍රය මගින් හා පැරණි වාහන රට තුළට ඒම සීමා කිරීම සඳහා වූ 2016 ජුනි 14 දිනැති අංක 1971/10 දරන ගැසට් පත්‍රය මගින් නීති විරෝධි ආනයනයන් රටතුළට ඒම වළක්වා තිබුණි. එහෙත් රේගු දෙපාර්තමේන්තුව අතර අන්තර් සම්බන්ධතාවයක් නොපැවතීම හා දෙපාර්තමේන්තුවේ පාලන පද්ධතියේ පවතින දූර්වලතා හේතුවෙන් ආනයන බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු ඒ සම්බන්ධව පසුවිපරම් කිරීමේ ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව සතුව නොපැවතුණි. | මේ පිළිබඳව නිලලත් සාකච්ඡාවක් සඳහා මුදල් අමාත්‍යාංශයේ, වෙළඳ තිරු බදු ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධානත්වයෙන් හා නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා රේගුව හා අප දෙපාර්තමේන්තුවේ සහභාගිත්වයෙන් 2022 අප්‍රේල් 18 වන දින මුදල් අමාත්‍යාංශයේදී පැවැත්වුණි. එහිදී ශ්‍රී ලංකා රේගුව සහ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව අතර විධිමත් හා ක්‍රමවත් අන්තර් සම්බන්ධතාවයන් ගොඩනඟා ගත යුතු බවට තීරණය විය. විශේෂයෙන්ම පිළිගත් ඉලක්කගත ක්‍රමවේදයන් හරහා සහසම්බන්ධතාවක් පවත්වාගෙන යා යුතු බවටද තීරණය විය. | බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ගැසට් නිවේදනවලට අනුකූලව සිදු කළ යුතු අතර ආනයන බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු ඒ සම්බන්ධව පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම කළ යුතු වීම. |
| (ආ) ජාතික ආර්ථිකය සතු විනිමය රට තුළ රඳවා ගැනීම වෙනුවෙන් ඇතැම් භාණ්ඩ ආනයනය සඳහා සීමා පනවා තිබුණු අතර ඒ පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| **(i)** දෙපාර්තමේන්තුවේ “කොවිඩ් 19” නමින් අංශයක් පිහිටුවා ආනයනය තාවකාලිකව අත්හිට වූ භාණ්ඩ ආනයනය | කොවිඩ් 19 අංශයෙන් තාවකාලිකව අත්හිටවූ භාණ්ඩ ආනයනය සඳහා ආනයනය කරුවන් විසින් ලබා දෙන ඉල්ලීම්, දිනයට අනුව ලේඛණයක | ගැසට් මගින් පනවා ඇති රෙගුලාසි ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | සඳහා ආනයනකරුවන් වෙත විශේෂ අවසර පත්‍ර නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. එහෙත් වර්ෂය තුළදී රැස් කරන ලද අවසර පත්‍රවල ලැයිස්තුවක් දෙපාර්තමේන්තුවේ එම අංශය සතුව නොතිබීම නිසා තාවකාලිකව ආනයනය තහනම් කළ භාණ්ඩ කොතරම් ප්‍රමාණයකට අවසර පත්‍ර ලබාදී තිබුණේ දැයි තහවුරු කර ගැනීමට විගණනයට සාක්ෂි නොලැබුණි. | පිළිවෙලට සඳහන් කර ඇත. එම ලේඛණය පරිදි අදාල එක් එක් දිනයන්ට ගොනු නඩත්තු කර ඇත. අනුමත කරන ලද හෝ නොකරන ලද බව අදාල ලේඛණයේ ආනයනකරු ඉදිරියේ සඳහන් කර ඇත. මෙම ලේඛණය මුල් කාලයේදි පරිසණක ගත නොවුවද මේ වන විට පරිසණක ගතව ක්‍රියාත්මක වන අතර ලබා දී ඇති අනුමැතීන් ප්‍රමාණය කොපමණද යන්න නිරික්ෂණය කල හැක. | -එම- |
| (ii) | අසම්පූර්ණ අයදුම්පත් සඳහා ද අවසර පත්‍ර නිකුත් කර තිබුණු අතර අදාල අයදුම්පත් නිසි පරිදි ගොනු ගත කර ද නොතිබුණි. | අනුමැතින් ලබා දීමට ප්‍රමාණවත් කරුණු පමණක් අයදුම්පත්‍රයේ සඳහන් වුයේ නම් අදාල අනුමැතිය ලබා දීමට කටයුතු කර ඇත. කෙසේ නමුත් මුල් කාලයේදි පැවති රාජකාරි කාර්ය බහුලතාවය මත එසේ වුවද මේ වන විට විධිමත් පරිදි එම ක්‍රියාවලිය සිදුවිමට කටයුතු යොදා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | -එම- |
| (iii) | 2021 ජුනි 21 දිනැති අංක 2231/18 ගැසට් පත්‍රයේ 8 ඡේදයේ සඳහන් කර තිබූ පාලනයෙන් බැහැරවද භාණ්ඩ ආනයනය කළ අවස්ථා පැවතීම මෙන්ම ආනයන සීමා කර තිබුණ ද පසුගිය වර්ෂ 05 සමඟ සංසන්දනය කර බැලීමේදී සමාලෝචිත වර්ෂයේ නිකුත් කර තිබූ ආනයන බලපත්‍ර සංඛ්‍යාව සීඝ්‍ර ලෙස ඉහළ ගොස් තිබීමෙන් ආනයන මත සම්භාධක පැනවීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොමැති අවස්ථා පැවති බවද නිරීක්ෂණය වීම. | 2021 ජුනි 11 දින ප්‍රකාශයට පත් කර ඇති 2231/18දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් එහි උපලේඛන අංක (1) මඟින් දක්වා ඇති නිශ්චිත භාණ්ඩයන් ශ්‍රී ලංකාවට ආනයනය කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත. **(Temporary Suspensions)** එහෙත් තීරු බදු නිර්ණය කිරීමේ කමිටුවේ අවසරය මත විශේෂ අවස්ථාවලදී හා අත්‍යවශ්‍ය අවස්ථාවලදී ඡේද අංක (8) හි සඳහන් ඉහත කී උපලේඛනයෙ හි අයිතම ආනයනයට අවසර දී තිබේ. නමුත් ඔබ විසින් සඳහන් කර ඇති පසුගිය වර්ෂයන්හි සඳහන් ආනයන බලපත්‍රයක් විශේෂ ආනයන පාලන බලපත්‍ර යටතේ නිකුත් කරන ලද ආනයන බලපත්‍රයක් ලෙස සැළකිය යුතුය. කොවිඩ් -19 වසංගතයක් සමඟ ඩොලරය ශක්තිමත් කිරීමේ අරමුණින් සහ ගෙවුම් ශේෂය මත වන අසාමාන්‍ය හිඟ පරතරය වැඩි වීමේ ප්‍රවණතාව අඩු කිරීමේ අරමුණින් සහ මහා බැංකුවේ මුල්‍ය | |

(ඇ)

සංචිත මත වන මුල්‍ය පීඩනය අවම කිරීමේ අරමුණින් ඉහත සඳහන් අයිතම 2021.06.11 දිනැති 2231/18 දරන අති විශේෂ ගැසට් පත්‍රය නිකුත් කර ඇත. එම නිසා 2021 වර්ෂයේ බලපත්‍ර ප්‍රමාණය ප්‍රමාණාත්මකව වැඩි වීමට මෙම භාණ්ඩ ලැයිස්තුවද හේතු විය.

බලපත්‍ර නිකුත් කිරීමේදී හා අතිරේක ගාස්තු අය කිරීමේදී නීති රීතිවලින් පරිබාහිරව කටයුතු නොකළ යුතුය.

බලපත්‍ර නිකුත් කිරීමේදී අතිරේක ගාස්තු අය කිරී නීති රීතිවලින් පරිබා කටයුතු නොකළ යුතුය.

රජය සතු පොහොර සමාගමක් විසින් 2021 ඔක්තෝබර් මාසයේදී බලපත්‍රයක් රහිතව ආනයනය කරන ලද පොහොර තොගයක් වෙනුවෙන් අයකළ යුතුව තිබූ අතිරේක ගාස්තුව වූ රු. 86,907,433 ක ආදායම අය නොකිරීමෙන් එම වටිනාකමෙන් දෙපාර්තමේන්තුවේ ආදායම අහිමි වී තිබුණි.

සිලෝන් ෆර්ටිලයිසර් ආයතනය විසින් ආනයනය කරන ලද පොහොර තොගය සඳහා වන බලපත්‍ර ගාස්තුවට අමතරව අයකළ යුතු (බලපත්‍ර නොමැතිව ආනයනය කිරීම වෙනුවෙන්) අතිරේක ගාස්තුව වූ රු.86,907,433ක මුදල මෙම දෙපාර්තමේන්තුව විසින් අය කරන ලද්දේ නම් ආසන්න වශයෙන් කිලෝ 50ක පොහොර බෑගයක් රු.250කින් පමණ ඉහළ යනු ඇත.

එම පොහොර ආනයනය කරන අවස්ථාවේ දී රට තුළ පොහොර හිඟ වීම හා පොහොර මිල ඉතා අධික වීම හේතුවෙන් ගොවි ජනතාව මුහුණ දී තිබූ අර්බුදකාරී තත්ත්වය යම් තරමකට හෝ පාලනය කිරීමේ අදහසින් හා මෙම පොහොර ආනයනය කරන සමාගම රජය සතු සමාගමක් වීම යන කරුණු සළකා බලා අදාළ අතිරේක ගාස්තු සීමා කිරීමට කටයුතු කරන ලදි.

(ඈ) සීනි කිලෝග්‍රෑම් එකක් සඳහා පනවා තිබුණු විශේෂ භාණ්ඩ බදු රු. 50 සිට ශත 25 දක්වා අඩු කිරීමෙන් බලාපොරොත්තු වූ සහනය පාරිභෝගික ජනතාවට ලැබීම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා වූ විශේෂ විගණනයේ දී පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරුණි.

ගැසට් මගින් ආනයන පනවා තිබූ පාලනයන් ර අපේක්ෂාවන් පරිදි කිරීමට අවශ්‍ය කටයුතු යුතුයි.

ගැසට් මගින් ආනයන මත පනවා තිබූ පාලනයන් රජයේ අපේක්ෂාවන් පරිදි ඉටු කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුයි.

(i) ආනයනික සීනි සඳහා බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දෙමින් 2020 ඔක්තෝබර් 29 දිනැති අංක 2199/20 දරන අති විශේෂ ගැසට් පත්‍රය නිකුත්

සීනි ආනයනය නියාමනය කිරීම සඳහා යෝග්‍ය ක්‍රියාමාර්ගයක් සකස් කර දෙන ලෙස අදාල අමාතයාංශය වෙතින් ඉල්ලීම් කළ අතර ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| | කිරීමට මුදල් අමාත්‍යවරයා විසින් කටයුතු කර තිබුණ ද මේ සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදයන් පිළිබඳ යම් උපදෙසක් මුදල් අමාත්‍යාංශය විසින් ලබා දී ඇති බව නිරීක්ෂණය නොවීය. ඒ අනුව සීනි ආනයනය පාලනය කිරීමට අවශ්‍ය නිර්ණායක හඳුන්වා දීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සීනි ආනයනය සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කළ සියලුම ඉල්ලුම්කරුවන්ට ඔවුන් ආනයනය කිරීමට ඉල්ලුම් කළ සියලු තොගයන් ආනයනය කිරීමට ආනයන හා අපනයන පාලක විසින් අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව මෙලෙස ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් සිය වෘත්තීමය වගකීම මැණවින් ඉටුකර නොමැතිවීම හේතුවෙන් ආනයන බලපත්‍ර හඳුන්වා දීම මඟින් ආනයනය පාලනය කිරීමේ හෝ විනිමය ගලායාම පාලනය කිරීමේ රජයේ අපේක්ෂාවන් බලාපොරොත්තු වූ පරිදි ඉටු වී නොතිබුණි. | වෙත අදාළ ආයතන මගින් යෝජනා නොකළ බැවින් සීනි සඳහා බලපත්‍ර නිකුත් කිරීම 2020.11.18 සිට ආරම්භ කරන ලදී. ඒ අනුව, සීනි ආනයනය වෙනුවෙන් බලපත්‍ර නිකුත් කිරීමේ දී, නියාමනය සඳහා පාදක කර ගත් ප්‍රධානතම කරුණ වූයේ දින 180ක ණය පදනම මත සීනි ආනයනය කිරීමේ හැකියාවයි. එලෙස ණය පදනම මත ආනයනය කිරීමට නොහැකි ආනයනකරුවන්ට සීනි සඳහා බලපත්‍ර නිකුත් නොකරන ලද අතර එබැවින් ණය පදනම මත ආනයනය කල හැකි ආනයනකරුවන් පමණක් බලපත්‍ර ඉල්ලුම් කරන ලදී.<br>මේ හරහා එකල මූලික අරමුණව පැවති විදේශ විනිමය ගලා යාම පාලනය කිරීමේ රජයේ අපේක්ෂාව දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී.<br>උක්ත කරුණට අමතරව, දේශීය දුඹුරු සීනි නිෂ්පාදනය දේශීය පාරිභෝජන අවශ්‍යතාව සැපිරීම සඳහා ප්‍රමාණවත් වන බව උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හඳුනාගෙන ඉල්ලීම් කල බැවින් 2021.02.21 දින සිට දුඹුරු සීනි සඳහා ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම අත්හිටුවා ඇත. ඒ මගින් දේශීය දුඹුරු සීනි කර්මාන්තකරුවන් ආරක්ෂා කිරීම සහ විදේශ විනිමය රටින් පිටතට ගලායාම අවම කිරීම අපේක්ෂා කෙරේ. |
| **(ii)** | සීනි ආනයනය සඳහා වන බලපත්‍ර ක්‍රමය 2020 ඔක්තෝබර් 30 දින සිට ක්‍රියාත්මක වුවද බලපත්‍ර නිකුත් | හදිසි ප්‍රතිපත්තිමය තීරණයක් මත ගැසට් පත්‍රයක් නිකුත් කලද ආනයනකරුවන් කිහිපදෙනකු ඒ වන විටත් ණයවර ලිපි විවෘත කර ,භාණ්ඩ ඇනවුම් කර හෝ |

-එම-

| | | | |
|---|---|---|---|
| | කිරීම 2020 නොවැම්බර් 18 වන දින දක්වා ප්‍රමාද වී ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව බලපත්‍ර ක්‍රමය හඳුන්වාදීමෙන් පසුව බලපත්‍ර නිකුත් කිරීම ප්‍රමාද කළ කාල පරිච්ඡේදය තුළ සීනි මෙ.ටො. 101,527 ක් බලපත්‍ර නොමැතිව ආනයනය කිරීමට ආනයනකරුවන් 18 ක් කටයුතු කර තිබුණි. | සැපයුම්කරුවන් වෙතින් අදාල භාණ්ඩ වරායන් වෙත ප්‍රවාහනය කරමින් ආනයන ක්‍රියාවලිය ආරම්භ කර තිබුණි. එසේවුවද, යම් කිසි භාණ්ඩයක් ආනයනය බලපත්‍ර පාලනයට යටත් කළ විට එම භාණ්ඩ නැව්ගත කිරීමට පෙර බලපත්‍ර ලබා ගැනීම අපේක්ෂා කෙරේ. නමුත්, බලපත්‍ර ලබා නොගෙන ආනයනය කළද මෙම සීනි තොග නිෂ්කාශනය කිරීමට වලංගු ආනයන පාලන බලපත්‍රයක් ශ්‍රී ලංකා රේගුවට ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව මෙලෙස බලපත්‍ර නොගෙන ආනයනය කරන සිනි සඳහා බලපත්‍ර ගාස්තුවක් සහ අමතර ගාස්තුවක් ද අයකර රේගුවෙන් නිෂ්කාශනය කර ඇත. | -එම- |
| **(iii)** | 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව බලපත්‍ර නොමැතිව ආනයනය කරන ලද භාණ්ඩ සඳහා මි.ර.ගැ වටිනාකමින් සියයට 05 ක අතිරේක ගාස්තුවක් අය කළ යුතු වුවද ආනයන බලපත්‍ර නොමැතිව ආනයනය කර තිබූ සීනි තොගවල මි.ර.ගැ වටිනාකමින් සියයට 2 ක් පමණක් අය කිරීමට ආනයන හා අපනයන (පාලන) ජනරාල් විසින් තීරණය කර තිබුණි. එලෙස දඩ මුදල අඩුකර අය කිරීම සඳහා ආනයන අපනයන දෙපාර්තමේන්තුවට බලතල ඇතිබව නිරීක්ෂණය නොවූ අතර බලපත්‍ර රහිතව ආනයනය කර තිබූ සීනි මෙ.ටො. | 2016.02.11 දිනැති අංක 1953/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ **III** උපලේඛනය අනුව අතිරේක ගාස්තුව මි.ර.ගැ. වටිනාකමින් අවස්ථානුකූලව, භාණ්ඩ නැව්ගත කළ නමුත් භාණ්ඩ වරායට ලගා වීමට පෙර ආනයන පාලන බලපත්‍ර ලබා ගන්නා විට 4%ක් ලෙස සහ භාණ්ඩ වරායට ලගා වූ පසුව ආනයන පාලන බලපත්‍ර ලබා ගන්නා විට 5%ක් ලෙස අතිරේක ගාස්තුවක් අය කළ යුතුය. තවද 2016.02.11 දිනැති අංක 1953/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ අංක 3 රෙගුලාසිය මගින් පහත පරිදි පාලක ජනරාල් වෙත ගාස්තු සම්බන්ධයෙන් බලය පවරා ඇත.<br>**"**ආනයන හා අපනයන පාලන බලපත්‍ර ගාස්තු සහ අතිරේක ගාස්තු අවශ්‍ය පරිදි සංශෝධනය කිරීමේ බලය ආනයන හා අපනයන පාලක ජනරාල් සතු වේ **".**<br>ඒ අනුව, ඉහත සඳහන් කරන ලද ගැසට් පත්‍රයේ බලතල ප්‍රකාරව ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් කටයුතු කර ඇති ඇති බවත් නෛතික පදනමක පිහිටා මෙය සිදු කර ඇති බව දන්වා සිටිමි.<br>අඩුකර ඇති අතිරේක ගාස්තු මුදල ලෙස රු.433,120,147 දක්වා ඇති | |

| | | |
|---|---|---|
| | 294,085 ක් සඳහා එලෙස ගාස්තු අඩු කිරීම හේතුවෙන් රජයට අයවිය යුතු රු.433,523,216 ක මුදලක් අහිමි වී තිබුණි. | නමුත් දෙපාර්තමේන්තුව සතුව ඇති තොරතුරු අනුව අඩුකර ඇත්තේ රු. 37,039,589.42 පමණි. මෙම සහනය ලබා දෙන ලද්දේ 2020.10.30 දින සිට 2020.11.18 දින දක්වා එනම් බලපත්‍ර නිකුත් නොකරන ලද කාලසීමාවේදී භාණ්ඩ පටවන ලද ආනයනකරුවන් සඳහා පමණි. |
| **(iv)** | සීනි සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රධාන අරමුණක් වශයෙන් නිරීක්ෂණය වන්නේ බදු අඩු කිරීමෙන් පසු විශාල වශයෙන් සීනි ආනයනය කිරීම පාලනය කිරීම වේ. එහෙත් බලපත්‍ර නිකුත් කිරීමට පෙර මාසික සාමාන්‍යය ආනයනය කළ මෙ.ටො. ප්‍රමාණය 41,779 ක් වූ අතර බලපත්‍ර ක්‍රමය හඳුන්වා දීමෙන් පසු එය මාසිකව මෙ.ටො 61,714 ක් පමණ වන අතර එය සියයට 47 කින් පමණ ආනයන වැඩිවීමකි. ඒ අනුව බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දීම තුළින් අපේක්ෂිත අරමුණු ඉටු වී ඇති බවක් නිරීක්ෂණය නොවීය. | ශ්‍රී ලංකා රේගුවෙන් ලද 2020 වර්ෂයේ ආනයනික සීනි දත්ත අනුව මාසික සීනි ආනයනය 58,385 **MT** පමණ වේ. නමුත් බලපත්‍ර ක්‍රමය හඳුන්වා දීමෙන් පසුව එය 61,055 **MT** පමණ වේ. එය ආසන්න වශයෙන් 4.6% පමණ වර්ධනයකි. |